පාලිත තත්ව යටතේ බෝග වගා කිරීම.

10 පාඩම

Faculty of Technology
University of Ruhuna.

පාලිත තත්ව යටතේ බෝග වගා කිරීම යනු ?

වායව හා පාංශු යන පරිසර සාධක දෙකම බෝගයට උචිත පරිදි කෘතීමව පාලනය කර බෝග වර්ධනය, අස්වැන්න හා ගුණාත්මකතාවය වැඩි කර ගැනීම සඳහා බෝග වගා කිරීමයි.

<u>පාලිත තත්ව යටතේ බෝග වගා කිරීමේ වැදගත්කම්,</u>

- අහිතකර පාරිසරික තත්වයන් තුළ බාධාවකින් තොරව බෝග වගා කිරීමට හැකි වීම.
- රෝග හා පළිබෝධ හානිවලින් බෝග ආරක්ෂා කර ගත හැකි වීම,
- ඉහළ ගුණාත්මයෙන් යුතු වැඩි අස්වැන්නක් ලබා ගත හැකි වීම,
- අතු කැබලි මුල් අද්දවා ගැනීම පහසු වීම.

පරිසර තත්ව පාලනයට යොදාගන්නා උපක්‍රම

1. ***වසුන් යෙදීම,***

වසුන් ලෙස කොහු බත්,පිදුරු,පොලිතින්,පොල් අතු,ඉලුක්,මානා හා වෙනත් කොළ රොඩු භාවිතා කරයි.

<u>වසුන් භාවිතයේ වැදගත්කම්,</u>

- පසේ තෙතමනය හා උෂ්ණත්වය ආරක්ෂා වේ.
- ජලය වාෂ්පීකරණය අඩු වේ.
- වල් පැළ මතු වීම වැළකේ.
- රෝග කාරක ක්ෂුද්‍ර ජීවීන්ගෙන් හා වෙනත් කෘමීන්ගෙන් වන බලපෑම අවම වේ.

2. ***ඵල ආවරණය කිරීම,***
3. ***ශාක ප්‍රචාරක ව්‍යූහ භාවිතය,***

ශාක ප්‍රචාරක ව්‍යූහ යනු ?

බෝග වගාවේදී බෝගයට අවශ්‍ය පරිදි වායව පරිසර සාධක එකක් හෝ කිහිපයක් පාලනය කිරීමට භාවිතා කරන ව්‍යූහ වේ.



තාවකාලික ප්‍රචාරක ව්‍යූහ

තාවකාලික ප්‍රචාරක ව්‍යූහ යනු ?

බෝගයේ විවිධ අවස්ථාවලදී පාරිසරික සාධක පාලනය කිරීම සඳහා භාවිත කරනු ලබන ප්‍රචාරක ව්‍යූහ වේ.

❖ කුඩා පැළ අවදියේදී පැළ ආරක්ෂා කර ගැනීම සඳහා තාවකලික ප්‍රචාරක ව්‍යුහ භාවිතා කරයි.

පොලිතීන්වලින් යෙදූ තනි පැළ ආවරණ

I. තනි පැළ ආවරණය,

➢ අරමුණු :

- පැළ සිටවූ පසු අවට ක්ෂුද්‍ර පරිසරයේ ආර්ද්‍රතාවය ඉහළ අගයක පවත්වා ගැනීම,
- උත්ස්වේදනයෙන්,පළිබෝධකයන්ගෙන් ආරක්ෂා කිරීම.

II. පේළි ආවරණ

a) ආරුක්කු සහිත පේළි ආවරණ,

- බෝගය සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් ආවරණය කල හැකිය.

b) පා වෙන පේළි ආවරණ,

- බීජ සිටුවා ආවරණය කළ විට වැඩෙන බීජවලට ආවරණය ඔසවා ගෙන වර්ධනය වීමට හැකියාවක් ඇත,

III. පාත්ති ආවරණය

බීජ නිෂ්පාදනයට ලොකු ළූනු බල්බ සිටුවීමේ දී යොදන ලද පාත්ති ආවරණ

➢ අරමුණු :

- පැළ සිටවූ පාත්ති,තවාන් පාත්ති ආවරණය කිරීම මෙහිදී සිදු කරයි.

IV. ශාක ප්‍රචාරක

a) සූර්ය ප්‍රචාරක ව්‍යූහ.

- <u>වැදගත්කම්,</u>
  - මෙම ව්‍යූහ තුළ උෂ්ණත්වය,ආර්ද්‍රතාවය වැඩි වීම නිසා ප්‍රභාසංශ්ලේෂණය මනාව සිදුවන අතර දඩු කැබලි වලින් මුල් ඇද්දවීම වේගවත් කරයි.

b) ඒකීය සූර්ය ප්‍රචාරක



ඒකීය සූර්ය ප්‍රචාරකය

- <u>වැදගත්කම්:</u>
  - සූර්ය ප්‍රචාරකය තුළ උෂ්ණත්වය ඉහළ යාම නිසා හෝර්මෝන සක්‍රීය වී මුල් ඇද්දවීම සිදු වේ.
  - මේවා තුළ ආර්ද්‍රතාවය ඉහල යන බැවින් දඩු කැබලි වියළී යාම වැළකේ.

V. ජල සංරක්ෂණ ප්‍රචාරක ව්‍යූහ

➢ අරමුණු :

- වර්ෂාකාලයේදී ලැබෙන ජලය සංරක්ෂණය කර ගනිමින් වියළි කාලයේදී බෝග වගා කිරීමට මෙම ප්‍රචාරක ව්‍යූහ භාවිතා කරයි.
- ව්‍යූහය තුල අධික ආර්ද්‍රතාවයක් පැවතීම නිසා වියළි කාලයේදී ජලය වාෂ්ප වීම වැළකේ.

VI. උණුසුම් පාත්ති

➢ අරමුණු :

- විද්‍යුත් තාපන දගරය මගින් කෘතීමව අවශ්‍ය ප්‍රමාණයට ප්‍රරෝහණයට අවශ්‍ය උෂ්ණත්වය ලබා දේ.

VII. ශීත රාමු

➢ අරමුණ :

- ශීත රාමු තුළ විද්‍යුතය භාවිතා කර පැළ අධික ශීතලෙන් ආරක්ෂා වන උෂ්ණත්ව මට්ටමක් පවත්වා ගනී.

අර්ධ ස්ථිර හා ස්ථිර ප්‍රචාරක ව්‍යූහ

සාපේක්ෂව අඩු කාලයක් කල් පවතින ව්‍යූහ අර්ධ ස්ථිර ව්‍යූහ වේ.

➢ <u>බෝග වගාවේදී මෙම ව්‍යූහ තෝරා ගැනීමේදී සලකා බලන කරුණු.</u>

- වගා කරන බෝගයට ගැළපීම,
- වගා කරන ප්‍රදේශයට ගැලපීම,
- ගොවියාගේ ආර්ථික මට්ටම.

➢ <u>ව්‍යූහය සඳහා ද්‍රව්‍ය තේරීමේදී සලකා බලන සාධක.</u>

- කල් පැවැත්ම,
- ව්‍යූහය තුළ උෂ්ණත්වය පාලනය,
- ද්‍රව්‍ය වල මිල,

i. හරිතාගාර

හරිතාගාර මූලධර්මය ;

- දිවා කාලයේදී ලැබෙන සූර්යාලෝක ශක්තිය කෙටි තරංග වේ.එම විකිරණ හරිතාගාර භූමි පෘෂ්ඨය මගින් උරා ගෙන තාපය ලෙස ගබඩා කර ගනී. එම අවශෝෂණය කර ගත් තාපය දිගු තරංග ලෙස තාප විමෝචනය වේ.
- රාත්‍රී කාලයේදී ශාක ශ්වසනය පමණක් සිදු කරන නිසා වීදුරු ආවරණය පහලින් CO_2අධික සාන්ද්‍රණයකින් එකතු වේ.එමCO_2 ස්ථරය දිගු තරංග තාප විකිරණ පිට වීමට නොදී ප්‍රති පරාවර්ථනය සිදු කරයි.

❖ නිවර්තන කලාපීය රටවල හරිතාගාර

➢ අරමුණ:

- මෙම ව්‍යූහය තුළ පංකා මගින් ඇතුළත උණුසුම් වන වාතය පිටතට යැවීම සිදු කරයි.

<u>මෙම ව්‍යූහ භාවිතයේ වාසි</u>

- පංකාවෙන් ඇතුලු කරන වාතය පෙරහනකින් පෙරී එන සේ සකසා ඇත. මේ නිසා මෙහි රෝග,පළිබෝධ පාලනය වේ.
- අඛන්ඩ වායු ප්‍රවාහයක් ඇතුල සිට පිටතට ගැලීම නිසා බාහිරින් රෝග,පළිබෝධ අතුලු වීම වැළකේ.
  - ➢ **හරිතාගාර තුල උෂ්ණත්ව සංවේදී ව්‍යූහ සවිකර ඇති අතර ඒවා මගින් උෂ්ණත්වය අනවශ්‍ය ලෙස ඉහළ යන විට ස්වයංක්‍රීයව කුටිය පුරා ජල වාෂ්ප මිහිදුමක් ලෙස පතුරුවා උෂ්ණත්වය පාලනය කරයි.**

ii. පොලිතින් උමං(poly tunnel)

- හරිතාගාර වලට වඩා ලාභදායීව හා පහසුවෙන් සකසා ගත හැකිය.

පොලිතින් උමං

<u>පොලිතින් උමං තුළ ඇතිවන</u> <u>ගැටලු හා පිළියම් :</u>

- පහත රට ප්‍රදේශවලදී මේ තුළ උෂ්ණත්වය ඉහළ යාම:
    - එය වළකා ගැනීමට බිත්තියේ ඉහලින් වාතය ඇද දමන පංකා සවි කරයි.නැතහොත් වහලයේ ඉහලින් රත් වූ වායු ධාරා ඉවත් වන ආකාරයට වහලය සකසයි.
- බිත්ති සඳහා පොලිතින් වෙනුවට කෘමි ආරක්ෂිත දැල් භාවිතා කිරීමෙන් උමග තුළ වාතය උණුසුම් වීම හා අනවශ්‍ය පරිදි ආර්ද්‍රතාවය ඉහළ යාමෙන් වන හානි වළක්වා ගත හැකි වේ.
- කාලයක් ගත වනවිට වර්ශාව හා අනෙකුත් පරිසර සාධක වල බලපෑම නිසා පොලිතින් හෝ කෘමි දැල් මත ඇල්ගී වර්ධනය වීමෙන් ඒවා දුර්වර්ණ වී ආලෝකය ගමන් කිරීම සීමකාරී වේ.එම නිසා වසර 5-6 වරක් ආවරණය අලුත් කල යුතුය.

iii. ලැත් නිවාස (Lath house)

➢ අරමුණු :

- සුලගින් ආරක්ෂා වීම,
- ආර්ද්‍රතාව ඉහළ අගයක පවත්වා ගැනීම,සෙවණ සැපයීම,
- පළිබෝධකයින්ගෙන් ආරක්ෂා කිරිමට.

ලැත් නිවාස ආකාර :

1) ලණු ගෘහ

➢ අරමුණ :

- තෙතමනය හා ආර්ද්‍රතාවය පවත්වාගැනීමට හා සුළගින් ආරක්ෂා වීමටත් භාවිතා කරයි.
- උඩවැඩියා, ඇන්තුරියම් වැනි මල් සඳහා සුදුසුය.

<u>ගැටළු :</u>

- ඉක්මනින් ලණු දිරාපත් වීම,
- දිලීර රෝග ව්‍යාප්තිය.

2) දැල් ගෘහ

➢ අරමුණ :

- ආලෝකය පාලනය කිරීම.

දැල් ගෘහ

3) ලී පටි ගෘහ

➢ අරමුණු:

- සෙවණ ලබා දීම හා සුළඟින් පැළ ආරක්ෂා කිරීම සිදුවේ.
- තේ වගාවේදී තවාන් පැළ තැබීමට භාවිතා කරයි.

ලී පටි (ලැත්) නිවාස

<u>පරිසර තත්ව පාලනයේදී ඇතිවන ගැටළු,</u>

- ➢ ප්‍රචාරක ව්‍යූහ තෝර ගැනීම හා ඉදි කිරීම් තාක්ෂණය පිළිබද ගැටළු.
- ➢ බෝග වගා තාක්ෂණය නිවැරදිව භාවිතා නොකිරීම.
- ➢ අධික රසායනික පළිබෝධනාශක භාවිතය.
- ➢ අපද්‍රව්‍ය බැහැර කිරීම.

නිර්පාංශු වගාව

<u>නිර්පාංශු වගා ක්‍රමයක් තේරීමේදී අවධානය යොමු කල යුතු කරුණු :</u>

- පරිසරයෙන් ලබා ගත හැකි ඉඩ ප්‍රමාණය.
- යෙදවිය හැකි සම්පත් මූලධනය,
- පහසුවෙන් හා ලාභදායීව ලබාගත හැකි ස්වාභාවික හා කෘතීම මාධ්‍ය
- නිෂ්පාදිතයේ ගුණාත්මය,

1. ජල රෝපිත වගාව / පෝෂක ද්‍රාවණ තුල වගාව

ජල රෝපිත වගාව යනු ?

ජලීය වගා මාධ්‍යක බෝග වගා කිරීමයි.

❖ අංග සම්පූර්ණ පෝෂක ද්‍රාවණයක් බහාලූ බදුන් තුළ ඝන මාධ්‍යක ආධාර ඇතිව හෝ නොමැතිව බෝග වගා කිරීම මෙහිදී සිදු කරයි.

<u>පෝෂක ද්‍රාවණ තුල වගාව ප්‍රධාන වශයෙන් දෙකකට සිදු කල හැකිය.</u>

- ✓ *සංසරණය වන ක්‍රමය*
- ✓ *සංසරණය නොවන ක්‍රමය*

i. සංසරණය වන ක්‍රමය

පෝෂණ මාධ්‍යය සංසරණය සිදු වන ආකාරයට වගා කිරීම ක්‍රම කිහිපයකි.

➢ නොගැඹුරු පෝෂණ ද්‍රාවණ පටල තාක්ෂණය

- පෝෂක මාධ්‍ය සියුම් බෑවුමක සහිතව නොගැඹුරු ඇළියක තුල ගලා යාමට සලස්වයි.
- කුඩා බඳුනක සිටවන පැළ ඇළිය මධ්‍යයේ තබා වාෂ්පීකරණය සිදු වීම හා ආලෝකය සහිත වීම වැළැක්වීම සඳහා ඇළියේ දාර දෙක එකට සිටින සේ තබා කටු ගසා ත්‍රිකෝණාකාර නළයක සේ සකසනු ලැබේ.



➢ **ගැඹුරු පෝෂණ ධාරා තාක්ෂණය**



- මෙහිදී නොගැඹුරු ඇළියක් වෙනුවට ගැඹුරට සකස් කරන ලද ඇළියක් භාවිතා කරයි.

ii. නිශ්චල ද්‍රාවණ ක්‍රමය (පෝෂක චක්‍රීකරණය නොවනක්‍රමය)

1. මුල් ගිල්වූ වගාව
2. පා වෙන වගාව
3. කේශික අවශෝෂණ වගව

1. මුල් ගිල්වූ වගාව

- මෙම ක්‍රමයේදී බීට් රූට් ,කැරට් වැනි බෝග සඳහා ඝන මාධ්‍යයක් සහිතව අනෙකුත් බෝග සඳහා ද්‍රාවණ මාධ්‍යය පමණක්ද භාවිතා කරයි

අල බෝග හැර අනෙකුත් බෝග සඳහා,

➢ මෙහිදී,

- කලු පොලිතීන් වලින් ආවරණය කරන ලද රිජිෆෝම් පෙට්ටියටපෝෂක ද්‍රාවන දමා එහි පියනට පැළ සවි කර තබයි.

- බඳුන් පැළ තබන සිදුරු වලට අමතරව එක් සිදුරක් පෝෂක මාධ්‍ය නැවත සැපයීමට හා වාතය සංසරණය සඳහාත් හිස්ව තැබිය යුතුය.
- බඳුනේ පෝෂක ද්‍රාවනයට ඉහළින් ප්‍රමාණවත් හිස් අවකාශයක් පවත්වා ගෙන යාමෙන් මූල මණ්ඩලයේ ඉහළ $^{2}/_{3}$ ක කොටසක් වාතයට නිරාවරණය වීමත්,අනෙක් කොටස පෝෂක ද්‍රාවණය තුළ ගිලී පා වී තිබීමත් මගින් මුල් වර්ධනය සිදුවේ.

අල බෝග සඳහා ඝන මාධ්‍ය සහිත ව්‍යූහ

<u>ව්‍යූහ සකසා ගන්නා ආකාරය :</u>



අල බෝග වගාව සඳහා සැකසූ බඳුනක්

- මේ සඳහා 20-30 Cmගැඹුරු පෙට්ටියක් ගෙන එහි $1/3$ ක් පමණ පෝෂක ද්‍රාවණය පුරවා ගනී.
- ද්‍රාවණයට ඉහළින් 7.5 Cm පමණ හිස් අවකාශයක් තිබෙන සේ යකඩ දැලක් බඳුනට සවි කර එයට ජීවාණුහරිත කොහු බත් වැනි මාධ්‍යක් පුරවා පැළ සිටුවයි.

➢ පෝෂක ද්‍රාවනය කේශාකර්ෂණ ක්‍රියාවලියෙන් පැලවලට සපයයි.

2. පා වෙන වගාව

- ඇතුළත පෘෂ්ඨය කළු පොලිතින් ආවරණය කළ රිජිෆෝම් පෙට්ටියක් යොදාගනී.



පාවෙන වගා ක්‍රමය

- පැළ රෝපණ මාධ්‍ය සහිත දැල් බඳුන් වල සිටුවා එය සැහැල්ලු රිජිෆෝම් හෝ පා වීමට සැහැල්ලු තහඩුවක සිදුරු රඳවා පෝෂක මාධ්‍ය මත පාවීමට සලස්වයි.
- කෘතිම වායු ධාරවක් මගින් ද්‍රාවණය වාතනය වීමට සලස්වයි.
- සුදුසු බෝග : පළා වැනි සැහැල්ලු බෝග.

3. කේෂික අවශෝෂණ වගාව

- පතුලේ සිදුරු සහිත බඳුන් වල ඝන මාධ්‍ය පුරවා ඒ තුළ පැළ සිටුවා පෝෂක ද්‍රාවණය අඩංගු නොගැඹුරු තැටි මත බඳුනේ පතුල පෝෂක ද්‍රාවණයෙන් ගිලෙන සේ තබයි.
- කේශාකර්ෂණය මගින් ද්‍රාවණයේ රෝපණ මාධ්‍ය තුළින් ගමන් කර පැළයේ මුල්වලට ලැබේ.



කේෂික අවශෝෂිත වගා ක්‍රමය

➢ බඳුන් මාධ්‍ය :කොහුබත් සමග වැලි හෝ ගල් කුඩු සහිත මිශ්‍රණය

➢ සුදුසු බෝග : වැඩි වටිනාකමක් සහිත පැළැටි,
අලංකාර ශාක,
ගෘහාශ්‍රිත ශාක,

ඝන මාධ්‍ය තුළ වගාව

වගා මාධ්‍ය

- අකාබනික ස්වාභාවික මාධ්‍ය
  උදා: බොරලු,ගල් කුඩු
- කාබනික ස්වාභාවික මාධ්‍ය
  උදා: කාබනික දහයියා,ලී කුඩු,කොහු බත්,කොහු කෙදි.
- අකාබනික කෘතීම මාධ්‍ය
  උදා: රොක්වූල්,පර්ලයිට්(perlite),වර්මිකියුලයිට්(vermiculite)
- කාබනික කෘතීම මාධ්‍ය
  උදා: පොලිෆීනොල්(polyphenol)
  පොලිඊතර් (polyether)
  පොලිවයිනයිල්(polyvinyl)

<u>ඝන මාධ්‍යක් තෝරා ගැනීමේදී පහත ලක්ෂණ සහිත මාධ්‍යක් තෝරා ගත යුතුය.</u>

- නම්‍යශීලී බව,
- ජලය රඳවාගැනීමට ඇති හැකියාව,
- ප්‍රශස්ත වාතනය,
- විෂ සංඝටකවලින් තොර වීම.

වගා ව්‍යූහ විවෘත හෝ සංවෘත ක්‍රමයට භාවිතා කළ හැකිය.

- තිරස් වගා මලුවල වගාව
- සිරස් වගා මලුවල වගා
- කාණු/පාත්ති තුළ වගාව
- බඳුන් තුළ වගාව

තිරස් වගා මලුවල වගාව

- මෙවැනි මලු වගා බිමේ තිරස් අතට එක් මල්ලක කෙළවර අනෙක් වගා මල්ලේ කෙළවර ස්පර්ශ වන ලෙස තබා තනි පේළි හෝ දෙපේළි ක්‍රමයට තබයි.
- බිංදු ජල සම්පාදන ක්‍රමයට පෝෂක සැපයීම සිදු කරයි.



❖ කාණු/ පාත්ති තුළ වගාව

- විවෘත ක්‍රමයක් වන මෙය පිහිටි බිමේ 30-35 Cmගැඹුරට සාදන ලද කාණු තුළ පැළ සිටුවීම සිදු කරයි.

❖ සිරස් ලෙස රුදවූ වගා මලු තාක්ෂණය.

වයුහය සදාගන්නා ආකාරය:

- සිලින්ඩරාකාර,පාරජම්බුලකිරණප්‍රතිරෝධි,ඇතුළත කළු,පිටත සුදු පොලිතීන් යොදා ගනී.එය ජීවාණුහරිත කොහු කෙඳි වලින් පුරවයි.
- කුඩා දැල් බඳුන් වල සිටුවන පැළ එල්ලන ලද මලුවල සිදුරු තුළ තැබීම සිදු කරයි.
- සෑම බෑගයකම ඉහල කෙළවරේ පෝෂක මාධ්‍ය විසුරුම් ජල සම්පාදන හිසක් මගින් එහි ඉහළ අභ්‍යන්තරයට ඉසීම සිදුවේ.

❖ බඳුන් ක්‍රමය

- මෙය කාණු ක්‍රමයට සමාන වේ.නමුත් මෙහි දී පැළ සිටුවීම කරනුයේ ප්ලාස්ටික් හෝ මටි බඳුන් තුල වගා මාධ්‍ය සිටවීමෙනි.

වා ගත වගා තාක්ෂණය



වායව රෝපිත වගාව

- ➢ වායව පරිසරයේ එල්ලා වැටෙන මූල මණ්ඩලයක් ලැබෙන පරිදි සිදුරු තුලින් නළවල මූල මණ්ඩලය පෙට්ටි තුලට ඇතුල් කර මෙම ව්‍යුහය සකසා ගනී.
- ➢ මෙම වගා ක්‍රමයේදී මිනිත්තු 2,3 කට වරක් පෝෂණ ද්‍රාවණය සියුම් මීදුමක් ලෙස හෝ ඝන වලාවක් ආකාරයට ස්ප්‍රේ කරයි.
- ➢ **ඉඩ කාරක්ෂමව භාවිතා කිරීම සඳහා ඉංග්‍රීසි A හැඩැති ව්‍යුහයක් භාවිතා කරයි.**

ශාක පෝෂක ද්‍රව්‍ය සැපයුම

- ජල රෝපිත වගවේ දී යොදා ගන්නා අංග සම්පූර්ණ පොහොර මිශ්‍රණ ඇත.

  උදා: ඇල්බට් පොහොර, හයිඩ්‍රෝ ක්‍රිස්ටලෝන් හා හයිඩ්‍රො කැල්සියම් නයිට්‍රේට්, ටෝටල් ග්‍රෝ, ලොන්සින්

පෝෂක මාධ්‍ය නඩත්තුව හා පාලනය

- **පෝෂක මධ්‍යයේ PH අගය**
  - ප්‍රශස්ත PH පරාසය : 5.8 -6.5
  - PH අගය නිවැරදි කිරීම සඳහා මෘදු අම්ල හෝ භාෂ්ම යොදා ගනී.
  - උදා: H_3PO_4,0.1%NH_4OH,HCL/H_2SO_4
- **පෝෂක මාධ්‍යයේ විද්‍යුත්සන්නායකතාවය**

යම් ද්‍රාවණයක අඩංගු ද්‍රාව්‍ය ලවණ සාන්ද්‍රණය පෙන්නුම් කරන මිනුම විද්‍යුත්සන්නායකතාවය වේ.

- **ඒකකය :** ඩෙසිසීමන්(ds/m) මෙමගින් ද්‍රාවනයේ ලවණ සාන්ද්‍රණය මැන ගත හැකිවේ.නමුත් අඩංගු පෝෂක ප්‍රමාණයන් මැනිය නොහැක.
- **ප්‍රශස්ත විද්‍යුත් සන්නායකතාවය** :1.5 -2.5 ds/m
- විද්‍යුත්සන්නායකතා අගය වැඩි වූ විට එයට පිරිසිදු ජලය එකතු කළ හැකි අතර,එම අගය අඩු වූ විට එයට පෝෂක එකතු කළ යුතුය.

නිර්පාංශු වගාවේ වැදගත්කම,

- කම්කරු ශ්‍රමය අධිකව අවශ්‍ය කාර්යයන් නොමැති වීම.
- වගා බිමේ පිරිසිදු බව හා පස් රහිත නිසා රෝග පළිබෝධහානි අවම වීම.
- කෘෂි රසායන භාවිතය අවම වීම.
- ගුණාත්මයෙන් යුතු අස්වැන්නක් ලබා ගත හැකි වීම.

නිර්පාංශු වගාවේ ගැටළු

- තාක්ෂණික දැනුමක් සහිත පුහුණු ශ්‍රමයක් අවශ්‍ය වීම.
- නඩත්තු වියදම අධික වීම,
- ආයතනික පහසුකම් අඩු වීම.
- සුළු දෝශයක් නිසා ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල අධික වීම.

Written by,

Faculty of Technology,

University of Ruhuna

Faculty of Technology
University of Ruhuna.